# 2020.11.29 වන දින මහර බන්ධනාගාරය තුළ සිදු වූ සිද්ධිය සම්බන්දව සොයා බැලීම සඳහා පත් කරනු ලැබූ පංච පුද්ගල කමිටුවේ

# අතුරු වාර්තාව

2020.12.07

## පිළිගැන්වීම

ගරු අධිකරණ අමාත්‍ය,
ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මැතිතුමාට

# සංයුතිය

පංච පුද්ගල කමිටුව පහත සඳහන් විද්වතුන්ගෙන් සමන්විතය.

1. සරෝජිනී කුසලා වීරවර්ධන මහත්මිය

   (විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු)

2. ජනාධිපති නිතීඥ යූ.ආර්.ද සිල්වා මහතා

   (ප්‍රධාන නීති උපදේශක, අධිකරණ අමාත්‍යාංශය)

3. රෝහණ හපුගස්වත්ත මහතා

   (අතිරේක ලේකම් (පාලන) අධිකරණ අමාත්‍යාංශය)

4. ඩී.ආර්.එල්. රණවීර මහතා

   (විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති)

5. ගාමිණී ජයසිංහ මහතා

   (හිටපු බන්ධනාගාර කොමසාරිස්)

අතිරේක ලේකම්, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයෙහි නිශාන් ධනසිංහ මහතා ඉහත කී කමිටුවේ ලේකම් වශයෙන්ද පත් කරන ලදී.

## ප්‍රවේශය


| | |
|---|---|
| පසුබිම | 02 |
| ස්ථානීය පරීක්ෂණයෙහි නිරීක්ෂණ | 03 |
| අනුගමනය කළ ක්‍රියා පටිපාටිය | 05 |
| සාක්ෂි විශ්ලේෂණය | 07 |
| කමිටු නිරීක්ෂණ | 14 |
| කමිටු නිර්දේශ | 18 |

## පසුබිම

මහර බන්ධනාගාරයේ 2020.11.29 වන දින සිදුවූ ගැටුම්කාරී තත්ත්වයක් හේතුවෙන් දේපල ගිනිගෙන විනාශ විය, රැඳවියන් විශාල පිරිසක්ද, නිලධාරීන් කිහිප දෙනෙකු ද තුවාලවී, රැඳවියන් 11 දෙනෙකු පමණ මියගොස් තිබූ බවට තොරතුරු වාර්තා විය. ඒ මත පදනම්ව ඇතිවූ සිද්ධියට අදාලව විමර්ශනයක් සිදුකර, එම සිද්ධිය සිදුවීමට හේතු හා වගකිවයුතු පාර්ශවයන් සොයා ,ගතයුතු පියවර සහ එවන් සිදුවීම් නැවත සිදුවීම වළක්වාලීම සඳහා වන නිර්දේශ ඇතුළත් සවිස්තර වාර්තාවක් මාසයක් ඇතුලත ද, අතුරු වාර්තාවක් සතියක් ඇතුළත ද ලබා ගැනීම සඳහා වියතුන්ගෙන් සැදුම්ලත් පංච පුද්ගල කමිටුවක් ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතීඥ එම්.යූ. එම්.අලි සබ්රි මැතිතුමා විසින් 2020.12.01 වන දින පත්කරන ලදී.

## ස්ථානීය පරීක්ෂණයෙහි නිරීක්ෂණ

මෙම කමිටුව විසින් ප්‍රථමයෙන්ම අදාල සිද්ධිය සිදුවූ ස්ථානය නිරීක්ෂණය කිරීමටත්, අනතුරුව සෑම පාර්ශවයක්ම නියෝජනය වන පරිදි සාක්ෂි සටහන් කර, අතුරු වාර්තාව සතියක් ඇතුලත සැපයීමටත් තීරණය කරන ලදී.

මේ අනුව 2020.12.03 වන දින උදෑසන 9.00ට පමණ කමිටුවේ සියළුම සාමාජිකයින් මහර බන්ධනාගාරයට ගොස් ප්‍රධාන ගේට්ටුවේ සිට ඒ අවට ප්‍රදේශයද, මුළුතැන්ගෙය, ස්ටෝරු කාමරය, ලේඛණාගාරය, බන්ධනාගාර අධිකාරවරයාගේ කාර්යාල ප්‍රදේශය, සහකාර බන්ධනාාර අධිකාරීගේ කාර්යාල ප්‍රදේශය, ප්‍රධාන ජේලර් කාමරය, සිරකරුවන් ලියාපදිංචි කරන කාමරය, වේදිකාව, කෑම බෙදන ස්ථානය, සුභ සාධන ගොඩනැගිල්ල, සංගීත භාණ්ඩ තබන ස්ථානය, කර්මාන්ත අංශය, සිර දඬුවම් විදින අයවළුන් රඳවා ඇති කුටි, බාබර් සාප්පුව, බන්ධනාගාර රෝහල සහ රිමාන්ඩ් බන්ධනාගාර ගත අයවළුන් රඳවා සිටි ගොඩනැගිලි යනාදිය නිරීක්ෂණය කරන ලදි.

එහිදී ප්‍රධාන ගේට්ටුව අසල ඇති පිටතින් ගෙනෙන භාණ්ඩ, ස්කෑන් කිරීමේ යන්ත්‍රය තබා තිබූ කාමරයෙහි ලී පොලු, මුගුරු, යකඩ පොලු රාශියක් එකට ගොඩ ගසා තිබෙනු අයුරු දක්නට විය. සිරදඬුවම් විදින අයවළුන් රඳවා

ඇති මැදිරිත්, රිමාන්ඩ් බන්ධනාගාර ගත රැඳවියන් රඳවා ඇති ස්ථානත්, මුළුතැන්ගෙයත්, ඉදිරි ප්‍රධාන ගේට්ටුව අසල දෙපස වූ ගොඩනැගිලිත් හැරෙන්නට අනෙකුත් ගොඩනැගිලි ගිනි තබා, ගොඩනැගිලි කඩා බිඳ දමා ඇති අයුරුත්, පොළවෙහි තැන තැන ගඩොල්, උළු කැට විසිරී ඇති අයුරුත් නිරීක්ෂණය විය. මුළුතැන්ගෙයි තුළ තිබුණා යැයි කියා සිටින ශීතකරණ 03ක් ඒ අසල මිදුලේ පුළුස්සා තිබුණි. ඉතුරු වූ ආහාර විශාල ප්‍රමාණයක් මුළුතැන්ගෙයි තුළද, එම් 2 රිමාන්ඩ් මැදිරි අසලද දැකගත හැකි විය. මුළුතැන්ගෙය අසල වූ බොයිලේරුවේ තෙල් මිදුලට ගලාවිත් තිබුණි. "සිරකරුවෝද මනුෂ්‍යයෝය" යන සටහන තබා ඇති ගොඩනැගිල්ල ඉදිරිපස සුන්බුන් සමඟ ගිනිගත් අඟුරු ගොඩක් දැකගත හැකි විය. බන්ධනාගාර රෝහලත්, බන්ධනාගාර අධිකාරී කාර්යාලයත්, ලේඛනාගාරයත් සම්පූර්ණයෙන් ගිනි තබා තිබුණි. මෙම ගොඩනැගිලිවල තිබූ ලේඛන බොහෝමයක් දැවීගොස් සුදු පැහැති අළු ගොඩක් ලෙසට පෙනෙන්නට තිබුණි.

රිමාන්ඩ් බන්ධනාගාර ගතකර ඇති අයවළුන් රඳවා සිටි ගොඩනැගිලි වල වහලවල් කැඩී, විශාල සිදුරු නිරීක්ෂණය විය.

## අනුගමනය කළ ක්‍රියා පටිපාටිය

කමිටුවේ සාමාජිකයින් පස් දෙනාම, දඬුවම් විඳින සිරකරුවන් මෙන්ම රිමාන්ඩ් සිරකරුවන් මුණ ගැසී ඔවුන්ගෙන් සිද්ධියට අදාලව කෙටි විස්තරයක් ප්‍රථමයෙන් දැනගෙන, එසේ සාකච්ඡා කළ කිහිප දෙනෙකුව ගෙන්වා, ඔවුන්ගෙන් සාක්ෂි සටහන් කර ගැනීම සඳහා ප්‍රධාන ගේට්ටුව අසල ඉහල මාලයෙහි තිබූ කාර්යාලයට ඉදිරිපත් කිරීමට දැනුම් දී, ඔවුන්ගෙන් සාක්ෂි සටහන් කර ගන්නා ලදී.

එහිදී M 2 වාට්ටුවෙන් හතර දෙනෙකුගෙන්ද, L වාට්ටුවෙන් දෙදෙනකුගෙන්ද, P 1 වාට්ටුවෙන් එක් අයෙකුගෙන්ද සාක්ෂි ලබා ගන්නා ලදී.

ඉහත කී අයවළුන්ගෙන් සාක්ෂි ලබා ගැනීමෙන් පසුව සාක්ෂිකරුවන්ට බාධාවකින් තොරව නිදහසේ සාක්ෂි ලබා දීම සඳහා සුදුසු වාතාවරණයක් සලසාලමින්, පසු දින සාක්ෂිකරුවන්ව වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රයේ පිහිටි පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයට රැගෙන එන ලෙසට දන්වන ලදී.

මේ හැරෙන්නට රිමාන්ඩ් බන්ධනාගාරයේ දැනට සිටින සියළුම රැඳවියන්ගේ තොරතුරු එදිනමද ලබාගැනීමටත්, එමගින් ඇප ලබා ගැනිමට නියමිත

අයගේ නම් අදාළ මහේස්ත්‍රාත් අධිකරණ වලට ඉදිරිපත් කිරිමටත්, වහාම රැඳවියන්ගේ ඥාතීන්ට දුරකථනය මඟින් රැඳවියන්ගේ තොරතුරු දැනුම් දීමටත් බන්ධනාගාර අධිකාරී වෙත නියම කරන ලදී.

අනතුරුව දෙවන දිනයේදී එනම් 2020.12.04 වන දින, වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රයේ පිහිටි පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේදී සිර දඬුවම් විදින එක් තැනැත්තකු ද, රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින අයවළුන් දෙදෙනකු ද, බන්ධනාගාර නිලධාරීන් දෙදෙනකු ද සාක්ෂියට කැඳවන ලදී.

තුන්වන දිනයේදීද එනම් 2020.12.05 වන දින, ඉහතකී වැලිකඩ පුහුණු මධ්‍යස්ථානයේදීම මහර බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයාද, සිද්ධිය සිදු වූ අවස්ථාවේදී බන්ධනාගාර රෝහලේ ඖෂධ බෙදා දුන් සහ රැඳවියන් විසින් රඳවා ගෙන සිටි එක් බන්ධනාගාර නිලධාරියකුද, කොවිඩ් පාලන කමිටුවේ වෛද්‍යවරුයකුද සාක්ෂියට කැඳවන ලදී.

## සාක්ෂි විශ්ලේෂණය

ඉහත කී සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂි විශ්ලේෂණය කළ විටදී ප්‍රශ්නගත සිද්ධිය ආරම්භ වී ඇත්තේ 2020.11.29 වන දින සවස 3.30 ට පමණ M 2 වාට්ටුව අසල කෑම බෙදමින් සිටිය අවස්ථාවේදීය. M 2 වාට්ටුවේ කෑම බෙදන නිසා දොර විවෘතව තිබූ හෙයින් එහි සිටි බොල්වත්තේ කුමාර, එස්.එෆ් මංජු, මහේෂ්, මලින්ද, දේවි යන අයවළුන් ඉදිරියට පැමිණ ඒ අසල ඇති L වාට්ටුව දෙසට "ලොක් ඩවුන්" යැයි පවසමින් ගොස් ඇත. මෙම අවස්ථාවේදී එහි සිටි රැඳවියන් විසින් කෑම වතුර වගේ යැයි පවසමින් මැසිවිලි නගා ඇත. ඒ අතරතුර සමීර, ටානියා යන දෙදෙනා අගුළු දමා තිබු L වාට්ටුවේ ඉබ්බා කඩා ඇත. මෙම අවස්ථාවෙදී එම වාට්ටුව, COVID - 19 රෝගය නිසා වසා දමා තිබූ, කිසිවකුට එළියට නොයන ලෙසට දැනුම් දී තිබූ වාට්ටුවකි. අනතුරුව එහි සිටි රැඳවියන්ද එළියට පැමිණ ඇත.

ඉන් පසුව රැඳවියන් විසින් අනෙක් වාට්ටුවලද දොරගුලු කඩා රැඳවියන්ට එළියට පැමිණීමට සලස්වා, විශාල පිරිසක් එක් රැස් වූ විටදී උද්ඝෝෂණයක් ආරම්භ කර ඇත.

මහර බන්ධනාාරය තුළ මුළු රැඳවියන් සංඛ්‍යාව 2782 වූ අතර ඉන් රිමාන්ඩ් රැඳවියන් 2148ක් පමණ වූ බවට අනාවරණය විය. ඉතිරි අය දඬුවම් විඳින සිරකරුවන් වේ. මහර බන්ධනාගාරය තුළ රැඳවිය හැකි ප්‍රමාණයට වඩා තුන් ගුණයක ප්‍රමාණයක් ඒ වන විට රඳවා තිබූ බවට හෙළිදරව් විය.

මේ හැරෙන්නට මෙම අවස්ථාව වන විටදී බන්ධනාගාර තුළ කොවිඩ් පැතිරීම වැළැක්වීම සඳහා පත් කර තිබූ කොවිඩ් පාලන කමිටුව ගෙන තිබූ තීරණයක් මත කලින් PCR පරීක්ෂණ කර රෝගය වැළඳී නොතිබුණු වැලිකඩ බන්ධනාග ාර රෝහලේ රඳවා ගෙන සිටි වෙනත් රෝග වලින් පෙලුණු 112 දෙනෙක්, මහර බන්ධනාගාරයේ පිහිටි බන්ධනාගාර රෝහලට මාරු කර යැවීමට ගෙන තිබූ තීරණයක් මත, මහර බන්ධනාගාර රෝහලේ සහ එම පරිශ්‍රයේම වෙනත් ස්ථානයක රැඳවීමට කටයුතු කර ඇති අතර, බෝගම්බර රිමාන්ඩ් බන්ධනාගාරයෙන්ද පිරිසක්ද ගෙනවිත් මහර බන්ධනාගාරයෙන් පිටතින් තිබූ "කොරි" අංශයේ රඳවා තිබූ බවටත් අනාවරණය විය.

තවද මහර බන්ධනාගාරයේ සිටි රැඳවියන්ට කොවිඩ් - 19 රෝගය වැළඳී ඇත්දැයි පරීක්ෂා කර බැලීම සඳහා PCR පරීක්ෂණ 1000කගේ පමණ නොවැම්බර් මස 25 සහ 27 වන දිනයන්හිදී සිදු කර තිබූ බවටත්, එහි ප්‍රතිඵල 28 වෙනිදා සවසත්, 29 වන දා උදේත්, ලැබී තිබූ බවටත්, එහිදී නිලධාරීන්

06 දෙනෙකුට සහ රැඳවියන් 180කට පමණ කොවිඩ් - 19 රෝගය වැළඳී ඇති බවට තහවුරු වී තිබූ බවටත් අනාවරණය විය.

එපමණක්ද නොව ඉහත කරුණු නිල නොවන අන්දමට රෝහලින් පිටතටත් රැඳවියන් අතරටත් පත්ව තිබු බව අනාවරණය විය. මේ පිළිබඳව රැඳවියන් අප්‍රසාදයකින් හා බියකින් සිටි බවට වාර්තා විය. එසේම L වාට්ටුවේද කොවිඩ් -19 වැළඳුණු එක් අයෙකුද සිට ඇති අතර, එල් වාට්ටුව ඇතුළු ඇතැම් වාට්ටුවලද උණ රෝගය වැළඳුණු රෝගීන් පිරිසක් සිටි බවට සාක්ෂි ඉදිරිපත් විණි. ඔවුනට බන්ධනාගාර රෝහලෙන් රෝගය විමසා පරීක්ෂා කිරීමකින් තොරව පැනඩොල් ලබා දී තිබුණි.

ඉහත කී අන්දමට රිමාන්ඩ් සිර මැදිරි වල දොරගුලු කැඩීම නිසා එළියට පැමිණි රැඳවියන් 1000කටත් වැඩි විශාල පිරිසක් එක් රැස්ව උද්ඝෝෂණ කර ඇත. උද්ඝෝෂණයේදී ඉදිරිපත් කර තිබූ ප්‍රධාන ඉල්ලීම් ලෙසට දක්වා තිබුනේ,

01. ඇප ලබා දී තිබු රැඳවියන් නිවෙස් වලට යැවීම ප්‍රමාද වී තිබූ හෙයින්, තවදුරටත් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ රඳවා තබා නොගෙන නිවෙස් වලට යැවීම කරන ලෙසට

02. **COVID** - 19 රෝගය සඳහා සියළුම රැඳවියන්ට **PCR** පරීක්ෂණ කරන ලෙසට,

03. කොවිඩ් -19 රෝගීන් මහර බන්ධනාගාරයෙන් ඉවත් කරන ලෙසට

04. අනුභව කළ හැකි අන්දමට සුදුසු ආහාර ලබා දෙන ලෙසට.

රැඳවියන්ගේ ඉහත කී ඉල්ලීම් සලකා බැලීම සඳහා ප්‍රධාන ජේලර් ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙක් උද්ඝෝෂණ පැවැත් වූ ස්ථානයට පැමිණ රැස්වූ පිරිසකගේ ඉල්ලීම් ලබා දීමට සුදානම් කරන බවට දැන්වීමට පියවර ගෙන තිබුණද, පිරිස "හු" හඬ නගමින් ගඩොල්, ගල් කැබලි නිලධාරීන් දෙසට විසි කරමින් ගේට්ටුව දෙසට පැමිණ ඇත. නිලධාරීන් තම ජීවිත හා ආයතනයේ දේපල ආරක්ෂාව සඳහා පිටුපසට ගොස් ඇත. ඒ අතරතුර රැඳවියන් විසින් බන්ධනාගාර රෝහලේ සිටි නිලධාරීන් දෙදෙනෙකුව රඳවා ගෙන තිබූ බව ට සාක්ෂි වලින් අනාවරණය විය.

මේ අනුව පුද්ගලයින්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමටත් කලහකාරී තත්ත්වය මැඩ පැවැත්වීමටත් බන්ධනාගාර නිලධාරීන් විසින්,

01. ප්‍රධාන ගේට්ටුව දෙසට රැඳවියන්ට පැමිණිය නොහැකි අන්දමට අකුලන ගේට්ටුව වසා ආරක්ෂා කොට රැඳවියන්ට බන්ධනාගාරයෙන් පිටතට පැමිණිය නොහැකි අන්දමට රැකවල් යොදා ඇත.

02. රැඳවියන් දෙසට කඳුළු ගෑස් විසිකර ඇත.

03. බියගැන්වීමට අහසට වෙඩි තබා රබර් බුලට් වලින් සහ පසුව ජීව උණ්ඩ භාවිතා කර කලහකාරී තත්ත්වය මර්දනය කිරීමට වෙඩි තබා ඇත.

04. අවි ගබඩාවේ ආයුධ වැඩිදුර ආරක්ෂාව සඳහා එම ස්ථානයෙන් එළියට රැගෙන ගොස් සුරක්ෂිතව තැබීමට පියවර ගෙන ඇත.

05. අමතර ආරක්ෂාව සඳහා STF අංශය සහ පොලීසිය කැඳවා ඇත.

06. ගිනි නිවීම සඳහා ගිනි නිවන හමුදාවද කැඳවා ඇත.

පළමු අවස්ථාවේදී එක් රැඳවියෙකුගේ උර හිසට වෙඩි වැදී තුවාලවී ඇති අතර, පිරිස දෙපසට විසිරී ගොස් ඇත.

එනමුදු නැවතත් අඳුර වැටුනු පසුව රාත්‍රී 7ත් 9.00ත් අතර බන්ධනාගාර රෝහලෙහි සාමාන්‍ය ප්‍රමාණ බෝතල් වල දමා තිබූ ඩල්සිෆාම් නමින් හඳුන්වන බෙහෙත් සහ තවත් විවිධ පෙති වර්ග රැඳවියන් අතර බෙදා ගනිමින් රිසි

සේ පානය කර ඇත. අනතුරුව රැඳවියන් පිරිසක් ඔවුනොවුන් අතර දැඩි කලහකාරී අන්දමට වියරුවෙන් මෙන් හැසිරෙමින් පොලු මුගුරු, ආයුධ වලින් එකිනෙකාට පහර දෙමින්, දේපල වලට ගිනි තබා විනාශ කරමින් හැසිරී ඇත. මීට ඔවුන් අතර තිබූ පුද්ගලික අමනාපකම් මුල්වී ඇත. එහිදී "බොසා" යන අනුවර්ත නාමයෙන් හඳුන්වන තැනැත්තා ඔහුගේ ගෝල බාලයන් සමඟ "ලහිරු" නැමැත්තාට පහරදීම් සිදු කර ඇත. ලහිරු නැමැත්තාගේ කණ්ඩායමද පෙරලා "බොසා" ඇතුළු කණ්ඩායමට පහර දී ඇත. මෙම දෙදෙනා අතර මෙම සිද්ධිය සිදුවීමට දිනකට දෙකකට ඉහතදී නාන ස්ථානයේදී ආරවුලක් ඇති කර ගෙන තිබූ බවටද අනාවරණය විය. බන්ධනාගාරය තුළ එවැනිම පාර්ශව ගණනාවක් විවිධ වාට්ටුවල රඳවා තබා තිබී ඇති අතර මෙම අවස්ථාවේදී ඉන් එළියට පැමිණ ඔවුනොවුන් අතර පහර දීම් කරගෙන තිබුණි.

රැඳවියන් අතර 29 වන දින රාත්‍රී කාලයේ ඇතිවූ මෙම ගැටුම, දරුණු තත්ත්වයෙන් තිබී ඇති අතර, ඊට විශාල පිරිසක් සම්බන්ධවී ඇත. මෙහිදී, පිරිසකට කැපුම්, තැළුම්, තුවාල සිදුවී ඇත. කිහිප දෙනෙකු බිම වැටී සිට ඇති අතර, පසුව ඔවුන්ව රෝහලට ගෙන ගොස් ඇත. මේ අතර වරින් වර බන්ධනාගාර නිලධාරීන් විසින් වෙඩි තැබීම්ද සිදු කර ඇත. පිටතින් කැඳවන ලද ආරක්ෂක අංශ වලින් වෙඩි තැබීමක් සිදු කර නැත. මෙහිදී මිය ගිය පුද්ගලයන්ද සිට ඇත. 2020.11.30 වැනි දින උදේ මානව හිමිකම් අංශයෙන්

පැමිණ තිබෙන අතර ඔවුනට අකුලන ගේට්ටුවේ සිට රැඳවියන් හා සාකච්ඡා කිරීමටද අවස්ථාව සලසා දී තිබූ බවට කරුණු අනාවරණය විය.

නැවත 30 වන දින සවස් භාගයෙහිද රැඳවියන් අකුලන ගේට්ටුව අසලට පැමිණ ප්‍රකෝපකාරීව කළබල සිදු කර ඇත. රැඳවියන් වතුර ඉල්ලා ද කෑ ගසා ඇත. එම අවස්ථාවේදී ද නිලධාරීන් විසින් කලහකාරී පිරිස පාලනය කිරීම සඳහා වෙඩි තබා ඇත. ඒ හේතුවෙන් කිහිප දෙනෙකුට වෙඩි වැදී ඇත. එමෙන්ම මෙම කලහකාරී තත්ත්වය පසු දින එනම් දෙසැම්බර් 1 වන දින තෙක් තිබී ඇත.

වෙඩි වැදුණු රැඳවියන්ට ආසන්නයේ සිට වෙඩි තැබීමක් සිදු කලාද යන්න නිගමනය කළ හැකි වන්නේ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසුවයි. මේ අවස්ථාව වනවිට එය පවත්වා නැත. මරණ පරීක්ෂණ නොපවත්වා මළ සිරුරු ආදාහනය හෝ භූමදානය නොකරන ලෙසට බලධාරීන්ට කමිටුව විසින් දන්වන ලදුව ඔවුන් එලෙස නොකරන බවට පොරොන්දු වී ඇත. බන්ධනාගාර රෝහලෙන් පැහැරගත් බෙහෙත් පෙති අසාමාන්‍ය ලෙස පානය කිරීමෙන් කලාහකාරි පිරිසට උත්තේජනයක් ලැබුනේ ද යන්න විශේෂඥ මතයක් තුළින් නිගමනය කළ යුතුව ඇත. ඒ නිසා ඒ ගැන නිගමනයකට එළඹීම අවසාන වාර්තාවේ දී සිදු කරනු ඇත.

# කමිටු නිරීක්ෂණ

මෙම කමිටුවට මේ දක්වා ඉදිරිපත් වූ සියළු කරුණු සළකා බැලීමේදී ඉහත කී සිද්ධිය ඇති වීමට බලපාන ලද හේතු ලෙසට පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරන ලදී.

1. මෙම සිද්ධියට පෙර **COVID** - 19 රෝගය මහර බන්ධනාගාර රැඳවියන් අතර තිබූ බවට වාර්තා නොවුවත්, මෙම සිද්ධිය වූ දින දහවල් කාලයෙහි **COVID** - 19 වැළඳුනු රෝගීන් විශාල සංඛ්‍යාවක් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි සිටින බවට රැඳවියන්ට දැන ගැනීමට ලැබීමෙන් පසුව,

- රිමාන්ඩ් බන්ධනාගාරය තුළ තිබූ දැඩි තදබදය නිසාත්,
- රැඳවියන් අතර උණ රෝගය පැතිරී තිබීම නිසාත් ඒ නිසා ඇති වු ජීවිත ආවධානම මත රැඳවියන් දැඩි නොසන්සුන්තාවයට පත්ව, ඔවුන්ගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කරමින් උද්ඝෝෂණ කරන්නට පටන් ගැනීම සාධාරණ උද්ඝෝෂණයක් ලෙස නිරීක්ෂණය වේ. බන්ධනාගාර නිලධාරීන්ගෙන් කඩිනම් විසඳුම් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් එම උද්ඝෝෂණය දැඩි අන්දමින් පවත්වාගෙන ගිය බවට නිරීක්ෂණය වේ.

2. එම අවස්ථාවේ රිමාන්ඩ් සැකකරුවන් අතර සිටි විවිධ අපරාධයන්ට සම්බන්ධ වූ බවට චෝදනා ලැබ සිටි විවිධ කල්ලි මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් ඔවුනොවුන්ගේ පෞද්ගලික කෝන්තර සහ අරමුණු ඉෂ්ඨ කර ගැනීමට කල්ලි ගැසී එකිනෙකා අතර දරුණු අන්දමේ පහර දීම් සිදු කර තිබූ බවට නිරීක්ෂණය විය.

3. රැඳවියන් විසින් බන්ධනාගාර දේපළ සහ ලිපි ලේඛණ වලට ගිනි තබා, ආයතනය ගොඩනැගිලි කඩා බිඳ දමමින් විශාල හානියක් සිදු කර ඇති බව පැහැදිලිව නිරීක්ෂණය විය,

4. මෙම ගැටුම සිදු වූ අවස්ථාවේදී රැඳවියන් සතුව පරිශ්‍රයෙන් සොයාගත් ගල්, මුගුරු, යකඩ පොලු, මන්න, කඩු, පිහි, මෙන්ම ගිනි තැබීම සඳහා බොයිලේරුවෙන් ලබාගත් තෙල්ද තිබී ඇති මුත් කිසිවෙකු අත ගිනි අවි තිබී නැත. ගිනි අවි තිබී ඇත්තේ බන්ධනාගාර නිලධාරීන් සන්තකයේ පමණක් බවටත්, ගිනි අවි පාවිච්චි කර ඇත්තේ ඔවුන් පමණක් බවටත්, කමිටුවේ නිරීක්ෂණයයි.

5. මෙම ගැටුම් 29 වන දින සවස ආරම්භ වී රාත්‍රී කාලයේද 30 වන දින සවස් භාගයේද තිබී ඇති අතර, ඇතැම් රැඳවියන්

බන්ධනාගාර රෝහලෙන් පැහැරගත් විවිධ පෙති වර්ග පානය කර තිබු බවටත් ඉන් අනතුරුව දරුණු ගැටුම් වලට සහභාගී වී තිබූ බවටත් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ වලින් නිරීක්ෂණය විය.

6. මේ අතරතුර ජලනල කැඩී තිබූ නිසා ජල සැපයුමද 30 වන දින ආහාර සැපයුමද අඩාල වී තිබී ඇත.

7. මෙම සිද්ධියට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්ණ පරීක්ෂණයක් සිදු කරන බවට, සහ

8. මේ වනවිට මියගිය එකොළොස් දෙනාගෙන් දෙදෙනෙකුගේ මල සිරුරු හඳුනාගෙන ඇති බවටත්, උගත් මහේස්ත්‍රාත්වරයා විසින් මරණ පරීක්ෂණ පැවැත්වීමටත්, අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇති බවට තොරතුරු වාර්තා විය.

තවදුරටත් නිරීක්ෂණය කරනු ලැබුවේ,

- රුඳවියන්ට **PCR** සහ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂා කිරීම ආරම්භ කොට ඇති බව,
- **COVID** - 19 රෝගීන් මහර බන්ධනාගාරයෙන් ඉවත් කර ඇති බව

- ආහාර, ජලය, විදුලිය සැපයීම් යථාවත් කර ඇති බව,
- අධිකරණ වලින් ඇප ලබාදී හෝ දඩ ගෙවා ඇති සියළුම අයවළුන් අධිකරණ නියෝග ලැබුණු වහාම බන්ධනාගාරයෙන් ඉවත් කිරීමට පියවර ගැනීම ප්‍රමාද වී ඇති බව,
- සිරකරුවන්ට සහ සැකකරුවන්ට සිය ඥාතීන්හට දුරකථන පණිවිඩ ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානයක් ආරම්භ කොට ඇති බව,
- දැනට රිමාන්ඩ් බන්ධනාගාරය තුළ නොසන්සුන්තාවය පහව ගොස් බන්ධනාගාර නිලධාරීන්ගේ පාලනයට යටතේ පවතින බව.

## කමිටු නිර්දේශ

- ගරු නීතිපතිතුමා විසින් පොලිසියට දී ඇති උපදෙස් මත පැමිණිලි ඉදිරිපත් කිරීමෙන් පසු දඩ ගෙවා හෝ වැඩිදුර වාර්තා මඟින් ඇප මත මුදා හරින රැඳවියන් හැකි ඉක්මණින් PCR පරීක්ෂණයට ලක් කර COVID-19 වසංගතය ආසාදනය වූවන් සුදුසු ප්‍රතිකාර මධ්‍යස්ථාන කරා යැවීමටත් අනෙකුත් රැඳවියන් තම තමන්ගේ නිවෙස් තුළ ස්වයං නිරෝධායනයට ලක් කිරීම නොකඩවා බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට වහාම පියවර ගත යුතු බව,

- මහර බන්ධනාගායේ දීර්ඝ කාලීනව පවතින නිලධාරී හිඟය නැති කිරීම සඳහා නිලධාරී සංඛ්‍යාව වැඩි කිරීමට වහාම පියවර ගත යුතු බව.

- අමුත්තන් මුණ ගැසීමට ඉඩ නොදෙන කාල සීමාවේදී සුභ සාධක මධ්‍යස්ථාන හරහා ආහාර ඇතුළු අවශ්‍ය දේ රැඳවියන්ට ලබාදීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු බව,

- දෙනු ලබන ආහාර වල තත්ත්වය අනුභව කිරීමට සුදුසු ආකාරයට පවත්වාගෙන යාමට පියවර ගතයුතු බව,

- **COVID-19** රෝගය හැර වෙනත් රෝගී තත්ත්වයෙන් පෙළෙනා රැඳවියන්ට බෙහෙත් ලබා දීම වහාම යථාවත් කළ යුතු බව,

- දුරකථන පහසුකම් ලබා ගැනීමට ඇති අවස්ථාවන් වැඩි කර රැඳවියන්ගේ ඥාතීන් සමඟ සම්බන්ධ වීමට අවස්ථාව සලසා දිය යුතු බව,

- ඇප තබා ගැනීමට නොහැකි රැඳවියන් සම්බන්ධව බන්ධනාගාරය මඟින් මෝෂන් පත්‍ර ගොනු කර ඔවුන්ට පුද්ගලික ඇප මත නිවෙස් වලට යාමට කඩිනම් පියවර ගැනීම කළ යුතු බව,

- සිර දඬුවම් විඳිමින් සිටින අයගේ කාල සීමාව සලකා බලා වයස්ගත අයට මුල් තැන දෙමින් සිර ගෙදරින් පිට වීමට ක්‍රමවේදයක් වහාම ක්‍රියාවට නැංවිය යුතු බව,

- රජයේ දේපළවලට හානි සිදු කිරීම ඇතුළු අපරාධ ක්‍රියාවන් සිදු කර රැඳවියන්ට එරෙහිව පොලිස් පරීක්ෂණ කඩිනමින් සිදු කර විශේෂඥ වාර්තා වහාම ලබාගෙන ගරු නීතිපතිතුමා හරහා නඩු පැවරිය යුතු රැඳවියන්ට ඉක්මනින් නඩු පැවරීමට කටයුතු යුතු බව,

- නිලධාරීන් ගේ නොසැලිකිලිමත් ක්‍රියා සම්බන්ධව පරීක්ෂණ වලින් හෙළිදරව් වීමක් ගැන මෙම අවස්ථාවේදී කමිටුවට මතයක් ප්‍රකාශ කළ නොහැකි අතර, වඩාත් විස්තරාත්මක තොරතුරු ඇතුළත් පූර්ණ වාර්තාවක් ලබාදීමේදී ඒ ගැන අවධානය යොමු කරනු ඇත.

මෙම වාර්ථාවට ඇතුළත් වන්නේ මේ දක්වා ඉදිරිපත් වූ සාක්ෂි හා සිදු කළ නිරීක්ෂණයන් මත කළයුතු නිර්දේශය ඇතුළත් පංච පුද්ගල කමිටුවේ සියළුම සාමාජිකයින්ගේ එකඟත්වයෙන් සකසන ලද අතුරු වාර්තාවයි.

1. සරෝජනී කුසලා වීරවර්ධන මහත්මියය - ..............................

සභාපති

2. යූ.ආර්.ද.සිල්වා මහතා - ..............................

සාමාජික

3. රෝහණ හපුගස්වත්ත මහතා - ..............................

සාමාජික

4. ඩී.ආර්.එල්.රණවීර මහතා - ..............................

සාමාජික

5. ගාමිණී ජයසිංහ මහතා - ..............................

සාමාජික